**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය, (මාර්ගගත), සිව්වවන වසර - 2022**

**බදු නීතිය**

**(පැ තුනයි)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 06**

**ඕනෑම ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

**(අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)**

---

**1.** 'බදු මූලධර්ම වනාහි අදායම් වැඩි කිරීමට පමණක් නොව එහි පුරවැසියන් හට සමාජ හා ආර්ථික සමානාත්මතාවය ගෙන ඒම අරමුණු කරගත් ශක්තිමත් බදු ව්‍යුහයක් සහතික කිරීම උදෙසා උපාය මාර්ග සැකසීමට මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට නීති සම්පාදකයන්හට සහ පාලන ආයතන වලට උපකාරී වන මාර්ගෝපදේශ සමූහයකි.'

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදයට බදු ප්‍රතිපත්ති කෙතරම් දුරට බලපා තිබේද යන්න සාකච්ඡා කරමින් එම තත්ත්වය නිවැරදි කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න.

(ලකුණු 100)

**2.** කොටස් දෙකටම පිළිතුරු සපයන්න.

**(අ)** 'බදු මඟහැරීම (tax avoidance) සහ බදු වැලහීම (tax evasion) සමාන වූ බලපෑම් ඇති කරයි. එනම්, බදු අදායම අඩු කිරීම සහ ඒ මත පදනම්ව බදු බර අඩු කිරීමද සිදුවේ. එහෙත්, එකකින් හඟවන අදහස අනෙකට වඩා වෙනස්ය.'

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත තීන්දු ඇසුරින් බදු මඟහැරීම සහ බදු වැලහීම පිළිබඳ සංකල්ප ගෙනහැර දක්වන්න.

**(ආ) 'පැහැර හරින ලද බදු අයකර ගැනීම සඳහා දේශීය අදායම් කොමසාරිස් ජෙනරාල් වෙත මහත් වූ බලතල පවතින නමුත් ඒවා බදු ගෙවන්නා වෙත සෘණාත්මකව බලපෑ හැකිය.'**

**ඉහත ප්‍රකාශයේ වලංගු භාවය 2017 අංක 24 දරණ දේශීය අදායම් පනතේ පවතින ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරෙන් විවේචනාත්මකව අගයන්න. ඔබේ පිළිතුර නිශ්චිත උදාහරණ සමගින් තහවුරු කරන්න.**

(ලකුණු 50 x 2 = 100)

**3.** මහචාර්යය රවී සුබ්‍රමනියම්, කොළඹ මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය උපදේශක අංශයට අනුයුක්තව සේවය කරනු ලබන සියළු සුදුසුකම් සපුරා ඇති ජ්‍යෙෂ්ඨ මහාචාර්යය වරයෙකි. ඔහු ප්‍රධාන වශයෙන් ධනාත්මක චින්තනය පිළිබඳ දේශන සහ වැඩමුළු පවත්වන අතර ඔහු මාසික වැටුප ලෙස ජීවන වියදම් සහ පර්යේෂණ වියදම් දීමනාද ඇතුළුව රු. 400,000/- ක් ලබයි. වර්තමානයේ, ඔහු එම ඒකකයේ අධ්‍යක්ෂකවරයා වන අතර ඔහුගේ වැටුපට අමතරව මාසිකව රු. 20,000/- ක දීමනාවක්ද ලබයි. විශ්වවිද්‍යාලය, සෑම මසකම රු. 150,000/- ක් වැය කරමින් ඔහුට ඉන්ධන සහ රියදුරෙකු සපයයි. 2022 ජනවාරි මස සිංගප්පූරුවේ පැවැත්වෙන "යොවුන් උපදේශනය" නම් වූ ජාත්‍යන්තර සමුළුවකට නියෝජිතයකු ලෙස විශ්වවිද්‍යාලය විසින් ඔහුව නම් කරන අතර ඒ සඳහා විශ්වවිද්‍යාලයට රු. 1,000,000/- ක් වැය වෙයි. ඔහු සමුළුවෙහි හොඳම ඉදිරිපත්කරන්නාට හිමි සම්මානය දිනා ගන්නා අතර $ 1000/- ක මුදල් ත්‍යාගයක්ද ඇගයීමේ සහතිකයක්ද හිමිකර ගනියි.

තවද ඔහු, 'ධනාත්මක චින්තනය' නම් ග්‍රන්ථයෙහි කතුවරයා සහ ප්‍රකශකයාද වෙයි. අවාසනාවකට මෙන්, Covid වසංගතය හේතුවෙන් රු. 3,000,000/- පමණ වටිනා පොත් විකිණීමට ඔහුට නොහැකි වී ඇති අතර ඒවා පෞද්ගලික මුද්‍රණකරුවෙකු ළඟ අසුරා ඇත. ඔහු ඔහුගේ වියදම් පියවා ගැනීම සඳහා ඉහත දැක්වූ පොත්, ලැප්ටොප් පරිඝණක තුනක් සහ මුද්‍රණ ද්‍රව්‍ය ඔහුගේ සහෝදර ප්‍රකාශකයෙකුට

විකුණයි. එහෙත්, ඔහුගේ නිල සංචාරය අතරතුර සිංගප්පූරුවේ පැවති ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයකදී හොඳම පොතට හිමි සම්මානය ඔහුට හිමිවෙයි. ඔහු එම රු. 500,000/- ක ත්‍යාග මුදල, ශ්‍රී ලංකාවේ දුගී ජනතාවට උපකාරී වීම උදෙසා වූ රජයේ සමාජ සුබසාධන අරමුදල වෙත පරිත්‍යාග කරයි.

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත තීන්දු ඇසුරින් 2021/2022 තක්සේරු වර්ෂය සඳහා මහාචාර්යය රවී සුබ්‍රමනියම්ගේ බදු වගකීම පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

**4.** (අ) හෝ (ආ) යන කොටස් දෙකෙන් **<u>එක් කොටසකට පමණක්</u>** පිළිතුරු සපයන්න.

**<u>එක්කෝ</u>**

**(අ)** **'**අදායම් බදු තක්සේරුව වනාහි බදු ගෙවන්නන් විසින් ඔවුන්ගේ අදායම් බදු වාර්තාවල ගොනු කරන ලද තොරතුරු රැස් කිරීම සහ ලබා ගැනීමේ ක්‍රියාවලිය වේ. සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම, සියලුම පුද්ගලයන් සහ ඒකක තමන් උපාය ගත් අදායම් ස්වයංව ගණනය කර බදු වාර්තා ගොනුකොට ගෙවිය යුතු බදු ගෙවීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, අදායම් බදු වාර්තා ගොනු කිරීමෙන් අනතුරුව අදායම් බදු තක්සේරු කිරීම සිදුවේ.'

2017 අංක 24 දරණ දේශීය අදායම් පනතේ ප්‍රතිපාදන ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

**<u>නැතහොත්</u>**

**(ආ)** **'**දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් සිදු කළ බදු තක්සේරුවකට හෝ වෙනත් තීරණයකට බදු ගෙවන්නන් විසින් අභියෝග කළ හැකි ආකාරය ශ්‍රී ලංකා දේශීය අදායම් පනතේ XIII වන පරිච්ඡේදයෙහි දක්වා ඇති අතර බදු ගෙවන්නන් හා කොමසාරිස් ජෙනරාල් වෙත පවතින ක්‍රියාපටිපාටිමය ආරක්ෂණයන් සහ අවශ්‍ය කාල සීමාවන්ද සපයයි. සමාලෝචනය සහ අභියාචනා ක්‍රියාපටිපාටිය විධිමත්ව සහ වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ශ්‍රී ලංකා දේශීය අදායම් පනතේ එම විශේෂිත පරිච්ඡේදයෙහි දක්වා ඇති බවද සැලකිය යුතුය.

අදාළ නීතින් ඇසුරෙන් අභියාචනා කර්යපටිපාටිය විවේචනාත්මකව අගයන්න. එසේම, විනිශ්චිත තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 100)

**5.** Kidde Taste (Pvt) Ltd වනාහි ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත පුද්ගලික සමාගමකි. ළදරුවන් සඳහා වන ආහාර සහ ශක්ති ජනක පානයන් නිෂ්පාදනය කිරීම, සමාගමේ ප්‍රධාන ව්‍යාපාර වේ. සමාගම 2021/2022 තක්සේරු වර්ෂය තුළ පහත සඳහන් වියදම් දරා ඇත.

(අ) නව කාබනික ශක්ති ජනක ළදරු ආහාර වර්ගයක් සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම වෙනුවෙන් දරණ ලද නීතිමය සහ ලියාපදිංචි ගාස්තුව රු. 1,000,000/-;

(ලකුණු 20)

(ආ) පසුගිය වසර දෙකක කාලයට අදාළව තත්ත්ව සහතික ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ශ්‍රී ලංකා ජාතික ප්‍රමිතිය සහතික කිරීමේ අධිකාරියට (National Accreditation Authority) ගෙවූ රු. 500,000/-.දඩය;

(ලකුණු 20)

(ඇ) පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳව සමාගමේ කාර්යය මණ්ඩලය දැනුවත් කිරීම උදෙසා ළදරු ආහාර පර්යේෂණ පිලිබඳ විශිෂ්ටතා ඇති විදේශීය පෝෂණවේදීන් යොදා ගැනීම වෙනුවෙන් දරන ලද රු. 1,500,000/- ක මුදල;

(ලකුණු 30)

(ඉ) අඛණ්ඩ විදුලිය ඇනහිටීම් හේතුවෙන් හානියට පත්වූ පැරණි ශීතකරණ පද්ධතිය වෙනුවට මිලදී ගෙන ස්ථාපිත කරන ලද අභ්‍යන්තර ශීතකරණ පද්ධතිය වැඩිදියුණු කිරීමේ වියදම් ඇතුළුව දරන ලද කර්මාන්තශාලා නඩත්තු වියදම්. ස්ථාපිත කිරීම සඳහා දරන ලද සම්පූර්ණ වියදම රු. 3,500,000/-.

(ලකුණු 30)

(මුළු ලකුණු 100)

**6.** අර්ථලාභීන් අතර අදායම් පරතරය පියවීමට සහ දරිද්‍රතාවය පිටුදැකීමේ රජයේ ප්‍රවේශයන් හට ප්‍රාග්ධන ලැබීම් මත බදු පැනවීම සහාය වනු ඇති බව ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ මතය විය. මෙම පසුබිම මත අදායම් බදු සමඟ "වත්කම් සහ බැරකම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලැබීම්" පිළිබඳ වූ විධිවිධානය, 2017 අංක 24 දරණ පනත මඟින් නැවත හඳුන්වා දෙන ලදී.

**(අ)** 'ආයෝජන අදායම' සහ 'ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ලැබීම්' අතර වෙනස විමසන්න.

(ලකුණු 20)

**(ආ) 2017 අංක 24 දරණ පනත යටතේ** ප්‍රාග්ධන ලැබීම් මත බදු ගණනය කිරීමට අදාළව සඳහන් ප්‍රතිපාදන විශ්ලේෂණය කරන්න.

(ලකුණු 40)

**(ඇ)** ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අපේක්ෂාව ඉටු කිරීම උදෙසා උක්ත පනත යටතේ හඳුන්වා දී ඇති යාන්ත්‍රණය සමත් වේද යන්න පිළිබඳව විවේචනාත්මකව අදහස් දක්වන්න.

(ලකුණු 40)

(මුළු ලකුණු 100)

******************************************